# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

**6 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය**

නම/ විභාග අංකයඃ ........................................ කාලය : පැය 2 යි

### I කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. පාසලෙන් ඉටුවන ප්‍රධාන කාර්යය වනුයේ,
    1) විභාග සමත් වීමට අවශ්‍ය දැනුම ලබා දීම.
    2) නායකයින් තැනීම.
    3) නැණ ගුණ දහමින් යුත් පුරවැසියන් බිහි කිරීම.
    4) රැකියාවක් සඳහා පුහුණු කිරීම.

02. නිදහස් අධ්‍යාපනයේ පියා යන විරුදාවලියෙන් හඳුන්වනුයේ,
    1) ආචාර්ය විජයානන්ද දහනායක මැතිතුමා.
    2) එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා.
    3) අනගාරික ධර්මපාලතුමා.
    4) ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමා.

03. පාසලේ ඉතිහාසය යනුවෙන් අදහස් කරනුයේ,
    1) පාසලේ වර්තමාන තත්වයයි.
    2) පාසල ආරම්භ වූ දා සිට මේ දක්වා විකාශනය පිළිබඳ තොරතුරුයි.
    3) පාසල ආරම්භ වූ දිනයයි.
    4) පාසලේ සිටි විදුහල්පතිවරුන් ප්‍රමාණයයි.

04. පාසල අනාගතයේදී ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු හඳුන්වන නාමය වනුයේ,
    1) මෙහෙවර
    3) දැක්ම
    2) පරමාර්ථය
    4) ඉලක්කය

05. ස්වාභාවික සම්පතක් නොවන්නේ පහත දෑ අතුරින් කවරක් ද?
    1) ගොඩනැගිලි
    3) වනාන්තර
    2) ජලය
    4) හිරු එළිය

- අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. අප රටේ කුඩාම පරිපාලන ඒකකය වනුයේ ග්‍රාම නිළධාරී කොට්ඨාශයයි. ( )
07. "එක් පාසලක් විවෘත කිරීම සිරගෙයක් වසා දැමීමට හේතු වේ" ( )
08. පාසලක ශිෂ්‍ය ගුරු සංඛ්‍යාව අනුව සංවිධාන ව්‍යුහය වෙනස් නොවේ. ( )
09. සෑම අභියෝගයක්ම වනාහි ජීවිත සාර්ථකත්වයට තුඩු දෙන ශක්තියකි. ( )
10. ආචාර්ය සී.ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා 1931 දී ලංකා ජාතික සංගමයේ සභාපතිත්වය දැරීය. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා වරහන් තුළ දී ඇති වචන යොදා හිස්තැන් පුරවන්න.

11. පාසලේ ඉතිහාසය දැන ගැනීමට ……………………………….. උපකාරී වේ.
12. අලස බව හා ……………………………….. ඔබේ අභියෝග ජය ගැනීමට බාධා පමුණුවයි.
13. ශ්‍රී ලංකාවේ පළාත් ……………………………….. කි.
14. සැළසුම්කරණය තුළින් ……………………………….. සිදු වේ.
15. ……………………………….. ඖෂධවේදය පිළිබඳ මෙරට ප්‍රථම මහාචාර්යවරයා විය.

(සේනක බිබිලේ මහතා, 07, සම්පත් පිරිමැස්ම ,මාර්ටින් වික්‍රමසිංහ, ලොග් පොත, නාම ලේඛනය, ආවේගශීලි බව, සම්පත් අධිපරිභෝජනය, 09)

- අංක 16 සිට 20 දක්වා හිස්තැනට ගැළපෙන පිළිතුර තිත් ඉරිමත ලියන්න.

16. ශ්‍රී ලංකාවේ වැඩිම දිස්ත්‍රික්ක ගණනක් ඇති පළාත ……………………………….. පළාතයි.
17. නොකළ යුතු බවට සම්මතයේ පවත්නාවූ කොන්දේසි සියල්ල ……………………………වේ.
18. ජීව දත්ත පත්‍රිකාවක් මඟින් හඳුනාගනු ලබන්නේ ශිෂ්‍යයෙකුගේ ……………………………වේ.
19. පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට උපකාරී වන සෑම දෙයක්ම …………………………… ලෙස හඳුන්වයි.
20. බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක …………………………… කි.

(ලකුණු 02 ×20=40)

## 11 කොටස

- පලමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පලමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5කි.

1)

i. ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක කීයද?

ii. පාංශු සංරක්ෂණය උදෙසා ඔබට කළ හැකි ක්‍රියාකාරකම් 02 ක් නම් කරන්න.

iii. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ලබාදෙන සේවා 02ක් ලියන්න.

iv. අපට සේවා සපයන ආයතන වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් 02ක් ලියන්න.

v. පාසලේ පාලනයට සම්බන්ධ ප්‍රධාන තනතුර කුමක්ද?

vi. පාසල් සිසුන් වශයෙන් ඔබට පැවරෙන වගකීම් 02ක් ලියන්න.

vii. පාසලේ සංවිධාන ව්‍යුහය තුළ ඇති වෙනත් කමිටු 02ක් ලියන්න.

viii. පාසලට නීති පද්ධතියක් අවශ්‍ය වීමට හේතු 02ක් ලියන්න. (ලකුණු 02×8=16)

2)

i. ඔබ පාසලේ ආදර්ශ පාඨය ලියා දක්වන්න. (ල.02)

ii. පාසලෙන් සමාජයට සැපයෙන සේවාවන් 04ක් ලියන්න. (ල.04)

iii. පාසලේ ශිෂ්‍යයෙකු ලෙස ඔබට පැවරෙන වගකීම් 03ක් ලියා ඉන් එකක් කෙටියෙන් පහදන්න. (ල.05)

3)

i. ඔබ පාසල අයත් පළාත නම් කරන්න. (ල.02)

ii. ඔබ ප්‍රදේශයේ දක්නට ලැබෙන ස්වභාවික සම්පත් 04ක් ලියන්න. (ල.04)

iii. ජලයෙන් ඇති ප්‍රයෝජන 03ක් ලියා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

4)

i. යහපත් පුද්ගලයෙකු වීමට ඔබ ප්‍රගුණ කළයුතු ගුණාංග 02ක් ලියන්න. (ල.02)

ii. ඔබ දන්නා සිරිත් 04 ක් ලියන්න. (ල.04)

iii. ඔබ සතු දුර්වලතා 03ක් නම් කොට ඒවා මගහරවා ගැනීමට ඔබට කළහැකි දෑ කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

5)

i. සැලසුම්කරණය යනු කුමක්ද? (ල.02)

ii. සැලසුම්කරණය ඔබේ ජීවිතයට කොතෙක් දුරට වැදගත්වේදැයි කරුණු 04ක් ඇසුරින් දක්වන්න.(ල.04)

iii. සැලසුම් සහගත නොවන පුද්ගලයාට ඇතිවිය හැකි ගැටලුමය අවස්ථාවන් කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

6)

i. ඔබ ප්‍රදේශයේ ජනතාව සාමූහිකව කටයුතු කරන අවස්ථා 02 ක් ලියන්න. (ල.02)

ii. සාමූහිකත්වයෙන් ලැබෙන ප්‍රයෝජන 04 ක් ලියන්න. (ල.04)

iii. ඔබ සාමූහිකව කටයුතු කරමින් අභියෝග ජයගත් අවස්ථාවක් කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

7)

i. අපට උදව්වන ආයතන 02ක් ලියන්න. (ල.02)

ii. ආගමික සිද්ධස්ථාන මගින් සිදුවන සේවා 04 ක් ලියන්න. (ල.04)

iii. ඔබ ප්‍රදේශයේ ඇති සමිති සමාගම් 05 ක් නම් කරන්න. (ල.05)